# 27 – අළුත් ඉරක් පායලා

අළුත් ඉරක් පායලා –අළුත් දිනක් උදා වෙලා
කුරුළු ගීත සිසිල් සුලං – රැලි අතරේ පාවෙලා
හරි ලස්සන මෙවන් දිනක් - සිත් සනසන මෙවන් දිනක්
ඔබයි අපට උදා කරන්නේ සමිඳුනේ

මෙදින මගේ වැඩ සියල්ල
සතුට සිනා කඳුළු මෙන්න //
ඔබ හට බාරයි – සමිඳෙ
ඔබ හට බාරයි

රටට සෙතක් උදා වෙන්න
ඒ වෙනුවෙන් වෙහෙස වන්න //
උදව් දෙනු මැනේ – සමිඳෙ
උදව් දෙනු මැනේ

දවස ගෙවී වැඩ වරන්න
වෙහෙස මැදින් තුති පුදන්න //
රකිනු මැනවි මා – සමිඳෙ
රකිනු මැනවි මා